

# තෙවරප්පෙරුම කොල්වින් සහ සර් ජෙනින්ග්ස්




පාලිත තෙවරප්පෙරුම වනාහි මා උපන් කලුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එජාපයේ බල කණුවකි. සිය බලය විදහාපාමින් පාසලකට දරුවන් ඇතුළත් කිරීම හෝ ප්‍රාදේශීය සභා නියෝජිතයකුට පහර දීම හෝ ඔහුට සුළු වැඩකි.

සරසවි සිසුන් මගඇර යන දේශපාලකයන් සිටින රටක ඔවුන් අතරට ගොස් කතා කිරීමට සවියක් ඇති ඔහු එසේ කරන කතාවෙන් සෑහීමකට පත්නොවන්නෙකි. තමාගේ නිල රථය මත නැගී ඔවුන් ඇමතීමට පවා එඩිතර නායකයෙකි.

මට එක්වරම සිහියට නැගෙන්නේ 1948 මැතිවරණයෙන් ජය ගත් කොල්වින් ආර් ද සිල්වා ය. ඔහු කොළඹ නගර මධ්‍යයේ රැස්ව සිටි ජනකාය ඇමතීමට නැංගේ ඔහුගේම වාහනය මතටය. වාහන දෙක අතර සුළු වෙනසක් ඇත. කොල්වින් නැගුණු කාරය ඔහුගේම මුදලින් - ඒ කාලයේ හැටියට රූ දහපහළොස්දාහකට - ගත්තකි. තෙවරප්පෙරුම නැගපු රිය එහෙම සුළු පටු එකක් නොව මහජන මුදලින් තමන්ට පුද කරනු ලැබූ ලක්ෂ ගණනක් වටිනා වස්තුවකි. එයට මිනිසකු දරා සිටීමෙන් සිදුවන හානියක් නැත.

මේ කියන එඩිතර දේශපාලකයාට අමතක කරුණක් ඇත. සරසවි සිසුන් බඳු බුද්ධිමතුන් පිරිසකට කතා කිරීම වේදිකාව මත හෝ රියක් මත හෝ බෙරිහන් දීමට වඩා වැදගත් විදියට කළ යුතු බවය - ඒ.

මෙතෙක් කිසිදු දේශපාලකයකු කිරීමට අසමත් වූ නොහොත් අමතක කළ වැදගත් කරුණද එයයි. අද සිටින සරසවි සිසුන් ඉස්සර හිටපු පිස්තෝලකාරයන් තරමට දරුණු යයි කිව නොහැකිය. ඔවුන් විරෝධය පාමින් මහමග හෝ කොටුවේ දුම්රිය පළ ඉදිරිපිට තමන්ගේ කාලය නාස්ති කළ යුතු අයද නොවන බව වටහා ගැනීමට අසමත් පුද්ගලයාට ඔවුන් ගැන වගකිවයුතු ඇමතිකම් දීම වගේම ලබා ගත් ඇමතිකම තමාගේ බලය පෙන්වීමට යොදා ගැනීමද ගැටලු අවුල් කිරීමක් බව නොතේරෙන නායකයන් සිටීමද රටටම දරාගත නොහැකි අලාභයකි.

ලංකා විශ්ව විද්‍යාලයේ පළමු උපකුලපති ධුරයට පත් වූ ඉංගිරිසි ජාතිකයා අපේ නායකයන්ටද උපදෙසු දුන් වියතෙකි. නිදහස් ලංකාවේ ව්‍යවස්ථාව මොහු විසින් සකස් කරන ලද බවද සැබෑවකි. ඔහු යටතේ සතර හදාළ බොහෝ දෙනා රටේ පාලනය සහ පරිපාලනය භාරව ක්‍රියා කළ බවද අමතක නොකළ යුතුය. ඔහු විසින් අර වාගේ විකාරකාරයන්ට දෙන ලද ආදර්ශය මතක් කර දිය යුත්තේ ඒ නිසාය.

1952 අග හරියේ දවසක සර් අයිවර් ජෙනින්ග්ස් කොළඹට ගොස් ආපසු පැමිණියේ පෙව 10 ට පමණ ය. ඔහුට දකින්නට ලැබුණෝ සිය නිල නිවාසය වටකර ගෙන තණ බිම මත වාඩි වී සිටි සිය ගණනක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ය. ඔවුන් එහි සිටින්නේ නිහඬ විරෝධතාවක් පළ කිරීමට ය. කිසි චකිතයක් නොමැතිව නිවස තුළට ගිය උප කුලපති මොහොතකින් පිටතට පැමිණියේ වටකරගෙන සිටි විරෝධතාකාරයන්ට පණ-විඩයක් දීමට ය.

"මට ඔබ සියලුදෙනාම එක්ක කතා කිරීමට බැහැ. ඔබේ නියෝජියන් කිහිපදෙනෙක් එවන්න. මට පුලුවන් ඔවුන් සමග සාකච්ඡා කරන්න"

ගතවූයේ විනාඩි පහකි. වහ වහා තෝරා ගන්නා ලද ක්‍රියාකාරී කමිටුව උප කුලපති නිවසට ඇතුල්වූහ. තව විනාඩි තිහක් ගත වූ පසු පිටතට ආ ඔවුන් තීරණය ගැන සතුටු වූ බව පෙනිණ.

බුද්ධිමත් පාලකයකුට බුද්ධිමත් තරුණයන් සමග කතා කොට ගැටලු නිරාකරණය කර ගත හැකි බව අර සුදු ජාතිකයා පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාව බිහිවීමට කලින් ය.

අද රටට ලැබී ඇති බලකාමී තමාගේ බලතල හා ලාභ ප්‍රයෝජන ගැන පමණක් සිතන බුද්ධිහීන නායකයන්ට ඒ මනුස්සයාගෙන් ගත හැකි ආදර්ශය මතක් කර දීමට සුදුසු කාලය එළැඹ ඇත .

## දමින්ද සුභාෂණ රත්නායක

(1993 දෙසැ 02 - 2016 මාර්තු 10)

දමින්දගේ හදිසි අභාවය දැනගැනීමෙන් ශෝකයට පත්ව (දමින්දව පුද්ගලිකව දැන සිටි හෝ නොසිටි) අප නිවසට පැමිණ අවමංගල්‍ය උත්සවයට පැමිණ අද දක්වාම අප හට නන් අයුරින් උපකාර වෙමින් මානව දයාවෙන් අප සනසවා අපගේ මහත් කම්පනය හා ශෝකය තුනී කරලීමට කටයුතු කළ ග්ලෙන්රෝයි හා මර්න්ඩා අසල්වාසීන් Masrden, McGain/APV සෝයුරන් වික්ටෝරියාහි ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි සිසු සංගමයේ සෝයුරන් දමින්දගේ ගුරු පියවරුන් හා පාසල් මිතුරන් මෙල්බර්න්හි ශ්‍රී ලාංකික ගුවන්විදුලි නාලිකා ඇතුලු මෙල්බන්හි ශ්‍රී ලාංකික ප්‍රජාවටද අපගේ හද පතුලෙන් අවංක ස්තූතිය පුද කරමු. ඔබගේ දයාව අප ටමහත් අස්වැසිල්ලක් හා ආශිර්වාදයක් විය.

**රොහන්ත අයිරිස් සහ චන්න**